# මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරුවලගහවත්ත ගම්මානයේ ගම්වැව් පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක්

**ඩී.එම්.ජී.පී. දිසානායක**[1]

ප්‍රමුඛ පද: ගම්වැව්, පද්ධතිය, යාපහුව, කරුවලගහවත්ත

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ පුරාණ සිංහලයන්ගේ සභ්‍යත්වය හා අවියෝජනීය ලෙස බැඳී පැවතුණු අංගයක් ලෙස වාරි පද්ධතිය හඳුන්වා දිය හැකිය. ඒ අතරින් වාරි ඉතිහාසයේ මුල්ම අවස්ථාව ලෙස ගම්වැව් පද්ධතිය හඳුනා ගත හැක. ශ්‍රී ලංකාවේ වැඩිම කුඩා වැව් සනත්වයක් දැක ගත හැකි වනුයේ වයඹ පළාතෙහිය. එහිදී වයඹ පළාතට අයත් ශ්‍රී ලංකාවේ සිව්වන රාජධානිය වන යාපහුව බලකොටුව ආසන්නයේ පිහිටි කරුවලගහවත්ත ගම්මානය කුඩා ගම්වැව් පද්ධතීන්ගෙන් සමන්විත අද්විතීය පරිසර පද්ධතියකට හිමිකම් කියයි. මෙවන් ග්‍රාමීය ප්‍රදේශයන්හි ගම්වැව් පද්ධතිය පිළිබඳ වාරි සංරක්ෂණය, විද්වත් අවධානය අඩුව, සාහිත්‍යමය පොත්පත්වලින් නිර්ලිඛිත ඛේදනීය ඉතිහාසයක් හා සියලු දෙනාගේ අවධානයට ලක් නොවූ වාතාවරණයක් තුළ මහව ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශයේ කරුවලගහවත්ත ගම්මානයේ ගම්වැව් පද්ධතියේ අතීත සහ වර්තමාන පසුබිම කෙබඳුද? යන ගැටලුව මුල්කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ප්‍රෞඩත්වයට උරුමකම් කියන යාපහුව රාජධානියට අයත් කරුවලගහවත්ත ගම්මානයේ ගම් වැව් පද්ධතියේ අතීත සහ වර්තමාන පසුබිම පිළිබඳව අධ්‍යයනය සිදු කිරීමයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේදී ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදයන් ද්විත්වය ඔස්සේ දත්ත එක්රැස් කරන ලදී. එහිදී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය යටතේ පුස්තකාල අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරමින් ප්‍රාථමික හා ද්විතීක සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු අධ්‍යයනය කිරීම සිදුකරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ කරුවලගහවත්ත ගම්මානයේ ගම්වැව් පද්ධතීන් වෙත ගොස් නිරීක්ෂණය කරමින් සහ මෙම ගම්මානයේ පැරණි ගම්වැසියන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වමින් දත්ත එක් රැස් කර ගන්නා ලදී.

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
gayanidisanayaka80@gmail.com

ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ප්‍රථම වරට වැවක් පිළිබඳ අසන්නට ලැබෙනුයේ අනුරාධ ඇමැතියාගේ අනුරාධ ගාමයේ පිහිටි වැවයි. මෙලෙස ආරම්භ වූ වාරි පද්ධතිය අතරින් ශ්‍රී ලංකාවේ වැඩිම කුඩා ගම්වැව් සනත්වයක් දැක ගත හැකි වන්නේ වයඹ පළාතෙහිය. දිවයිනේ වැඩිම ගම්වැව් ප්‍රමාණයක් රාශිභූතව ඇත්තේ යාපහුව - පඬුවස් නුවර නාගරික මධ්‍යස්ථානද්වය ඇතුළත් වර්ග කිලෝමීටර් 2500 ක් වූ බිම් ප්‍රදේශයේ ය. ඒ අතරින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යාපහු රාජධානියට කිලෝමීටර 03 ක් පමණ දුරින් පිහිටා ඇති කරුවලගහවත්ත ගම්මානය කුඩා ගම්වැව් පද්ධති 06 කින් සමන්විත වේ.

එම ගම්වැව් පද්ධති ලෙස ගලටබැඳි වැව, අලුත්වැව, මීගස් වැව, කුඹුක්ගහ වැව, කෝංගොල්ල වැව, කුඩා ඇහැටුවා වැව පෙන්වා දිය හැකිය. මෙම ගම්මානයේ ගම්වැව් එල්ලංගා පද්ධතියකට අනුව සැකසී ඇත. එසේම වැව් බැම්ම, සොරොව්ව, වාන, වැව්තාවුල්ල, බිසෝකොටුව, ඉහත්තැව, ඇළමාර්ග සහ අමුණු, කුළු වැව් ආදී ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණික අංගවලින් මෙම ගම්වැව් පද්ධතිය සැකසී ඇත.

කරුවලගහවත්ත ගම්මානයේ ගම්වැව් පද්ධතිය සඳහා අතීතයේ නම් සැදුණු ආකාරය ගම්වැසියන්ගෙන් ලද තොරතුරු අනුව හඳුනා ගන්නා ලදී. ගලටබැඳි වැව සඳහා එම නාමය ගල්වැටියක් සමඟ බැඳී ඇති බැවින් ලැබී ඇත. මී ගසක් අසළ පිහිටි වැව මී ගස් වැව නමින්ද, කුඹුක් ගස් වලින් යුතු ප්‍රදේශයක පිහිටි වැව කුඹුක් ගහ වැව ලෙසද, කෝංගස්වලින් යුතු ප්‍රදේශයක පිහිටි බැවින් කෝංගොල්ල වැව නමින්ද, කුඩා ඇහැටු ගසක් පිහිටි ප්‍රදේශයේ වූ වැව කුඩා ඇහැටු වැව ලෙසද නම් පට බැඳී ඇත. මේ අනුව මෙම ගම්මානයේ වැව් සඳහා නාමය සෑදීමට වැව පිහිටා ඇති පරිසර පද්ධතියේ මූලික වී ඇති බව පැහැදිලිව හඳුනාගත හැක.

කරුවලගහවත්ත ගම්මානයේ ගම්වැව් පද්ධතින් අතීතයේ සිටම ගම්වැසියාගේ ජන ජීවිතය හා අවියෝජනීය ලෙස බැඳී පැවති අංගයකි. ප්‍රධාන වශයෙන් අතීතයේ සිට කෘෂිකර්මාන්තය සඳහා මෙම ගම්වැව් පද්ධති භාවිතා කරනු ලබයි. එහිදී ප්‍රධාන වශයෙන් වී ගොවිතැන මෙම ගම්මානයේ ගම්වැව් පද්ධතිය හරහා සිදු වේ. ඊට අමතරව පානීය ජලය හා ජලජ ශාක ආහාරයට ගැනීම, සුළු රැකියා හා කර්මාන්ත සඳහා උපයෝගී වීම (ධීවර කර්මාන්තය, ගඩොල් කර්මාන්තය, පන් නෙලීම), දියනෑම සඳහා, සතුන්ගේ අවශ්‍යතා සඳහා ආදී වශයෙන් ගැමියාගේ එදිනෙදා ජන ජීවිතයේ ක්‍රියාකාරකම් උදෙසා ගම්වැව් පද්ධතිය භාවිතා කරනු ලබයි.

කරුවලගහවත්ත ගම්මානයේ ගම්වැව් පද්ධතිය හා බැඳි සංස්කෘතික ක්‍රියාකාරකම් හැඳින ගැනීමේදී කිරි ඉතිරීමේ මංගල්‍යය ප්‍රධාන වේ. එය අතීතයේ සිට වර්තමානය දක්වාම පැවත එන්නකි. ඊට අමතරව පිදිල්ල, බත් මාලාව, දුගී දානය

වැනි පූජා කර්ම ගම්වැව් පද්ධතිය හා බැඳී පවතී. එසේම ආගමික කටයුතු සඳහාද ගම්වැසියා වැව භාවිතා කරනු ලබයි. ගම්මානයේ වැව් බැම්මෙන් ගමන් කරන විට කුඩය ඉහළා නොයාම, කරේ තුවාය ඇත්නම් අතට ගැනීම , වැකන්දේ හරක් නොබැඳීම , වැකන්ද මතින් මළ සිරුරු රැගෙන නොයාම ආදී වූ සිරිත් විරිත්ද මෙම ගම්මානයේ ගම්වැව් පද්ධතිය හා බැඳි සංස්කෘතිකාංග ලෙස හඳුනා ගත හැක.

මෙම මහව ප්‍රදේශයේ වැව් කලාපයේ ජල ඌනතාවය සම්පූර්ණ කිරීම උදෙසා වැසි ජලය ක්‍රමවත්ව භාවිතා කිරීම, ජල සංරක්ෂණය සහ කළමනාකරණය, වැව් නිසි ලෙස නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම, වගා කටයුතු කාලය අනුව ක්‍රමවත් හා සැලසුම් කිරීම ආදී පියවර ඔස්සේ කටයුතු කරනු ලබයි.

නමුත් මෙම ගම්මානයේ ගම්වැව් පද්ධතිය වර්තමානය වන විට අතීතයේ තිබූ සුන්දරත්වය වියැකී ගොස්, ගම්වැසියා හා වැව අතර තිබූ සබැඳියාව දුරස්ව ගොස් විවිධ අභියෝගයන්ට මුහුණපා ඇති ආකාරය හඳුනා ගත හැකිය. නිසි නඩත්තු කටයුතු සිදු නොවීම, වැව් රක්ෂිත විනාශ වීම, නූතන සංවර්ධන ක්‍රියාවලීන්, වැව් අවභාවිතය, ආක්‍රමණශීලි පැළෑටි වර්ධනය, වැව් ගොඩවීම ආදී හේතු සාධක එහිදී මුල් වී ඇත. ඒ අනුව ගම්වැව් පද්ධතියේ සාර්ථකත්වය උදෙසා ගම්වැසියාගේ දැනුවත්භාවය, වැව් නඩත්තු කිරීම, පරිසර පද්ධතියට හානි නොකිරීම, ජල කළමනාකරණය කර භාවිතා කිරීම, කුළු වැව් ආරක්ෂා කිරීම ආදී වූ ක්‍රියාමාර්ග ඔස්සේ කටයුතු කළ යුතු බවට මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කරනු ලබයි. මෙම අධ්‍යයනය වාරි සභ්‍යත්වය රැක ගැනීම උදෙසා මනාව වැදගත් වේ.

## සමාලෝචනය

මහව ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශයේ කරුවලගහවත්ත ගම්මානය ගම්වැව් පද්ධතීන්ගෙන් ගහන ගම්මානයකි. ඒ අනුව මෙම අධ්‍යනය තුළින් මෙම ගම්මානයේ ගම්වැව් පද්ධතියේ අතීත සහ වර්තමාන පසුබිම කෙබඳුද? යන්න කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහිදී වැව් හට නාමය ලැබී ඇති ආකාරය, ගම්වැව් පද්ධතියේ භාවිතය, ගම්වැව් පද්ධතිය හා බැඳි සංස්කෘතිකාංග, ගම්වැව් පද්ධතිය කෙරෙහි වර්තමානයේ එල්ල වී ඇති අභියෝගයන් සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මෙම අධ්‍යනය තුළින් මනාව විශ්ලේෂණය කරයි.

## ආශ්‍රිත මූලාශ්‍රය

***මහාවංසය සිංහල,*** කිරම විමලජෝති ස්ථවිර, (සංස්). (1986). නැදිමාල - දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දිසානායක, සෙනරත්. ආනන්ද,වයි.ඩබ්.යූ. බණ්ඩාර, ටී.එම්.සී. (2001). ***යාපහුව.*** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ස්වර්ණසිංහ, කේ.එම්.අයි. (2005). ***අපේ වැවෙන් පැන් දෝතක්.*** පන්නිපිටිය වාග, ප්‍රකාශන.